# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1704/20 – 2011 මැයි 06 වැනි සිකුරාදා – 2011.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: කැප්‍රාලේ/අත්3/1/65.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අවශ්‍ය මහජන කාර්යය:-
කර්මාන්ත සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් ප්‍රධන කාර්යයාලීය ගොඩනැගිල්ල හා කර්මාන්ත සංවර්ධන සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේ පත්තුවේ සුළු කොට්ඨාසයේ මාම්පේ ගමේ පිහිටි මූලික පිඹුරු අංක කො. 9128 හි  සඳහන් ඉඩම් කැබලි එකක් (1).

ඉඩමේ නම: කොස්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි හතරක්ද, ස්ථිර ළිඳක්ද ඇත, කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් වඩු පාසැලක් පවත්වාගෙන යනු ලබයි; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.1136.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 ජුනි මස වැනි 16 වැනි දින පෙ.ව. 9.30ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 ජුනි මස 08 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂණයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

එල්. ඒ. කළුකපුආරච්චි,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් හා
අත්කර ගැනීමේ නිලධාරි
කැස්බෑව.

2011 මැයි මස 02 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය,
කැස්බෑව.

05 - 518

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 3/1/6/ඉ.අ/2006.

වයඹ පලාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජ වන්නි පත්තුව සුළු කොට්ඨාසයේ සාලියවැව හා පලුගස්සේගම ගමේ මැනුම්පති විසින් පිළියෙළ කර ඇති අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු අංක 22 සහ 2009.07.30 දිනැති පිඹුරේ සඳහන් කැබලි අංක 6684 සඳහා මා විසින් අංක 1622/15 හා 2009.10.06 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ඉඩම අත්පත් කර ගැනීමේ 7වන වගන්තිය යටතේ වන දැන්වීමෙහි පහත සඳහන් ඉඩම් කැබැල්ලේ ප්‍රමාණය අතපසුවීමකින් හෙක්. 0.0028 ලෙස සඳහන් වී ඇත. පහත දක්වා ඇති පරිදි එම ප්‍රමාණය හෙක්. 0.0026ලෙස නිවැරදි කර ඇතුළත් විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංකය 6684**

ඉඩමේ නම: රාජාංගනය වම් ඉවුර යාය 7; විස්තරය: ගෙවත්ත, සහිත ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය (අනවසරකරු- ඊ.ජේ. එන්. එම්. පෙරේරා, සඳමාල් වයින් ස්ටෝස්, 22වෙනි සැතපුම් කණුව, සාලියවැව හන්දිය); ප්‍රමාණය: හෙක්. 0.0026.

ඒ. එම්. සී. එම්. ප්‍රේමසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
කරුවලගස්වැව

2011 අප්‍රේල් මස 29 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කරුවලගස්වැව.

05 - 519

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අංක 1269/1 හා 2002 දෙසැම්බර් 30 වැනි දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද අංක අ.ග.පි. 3320 පිඹුරේ අංක 179 කැබැල්ලේ ප්‍රමාණය හෙක්. 0.326ක් යන්නට හෙක්. 0.310 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්ලිව්. එල්. ඩී. එන්. කුමාර
ප්‍රාදේශීය ලේකම්,
නවගත්තේගම

මගේ අංක - නව/ඉ/119/එල්ඒ 4516
ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක - 03/ජේ/82/අයිආර්/219
2011 මැයි මස 03 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
නවගත්තේගම.

05 - 520

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.